සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/DG/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ..................

දිනය / திகதி / Date: 2020.05.10

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය ලේකම්,
දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ,
ප්‍රාදේශීය සමෘද්ධි මූලස්ථාන කළමනාකරු,
සමෘද්ධි බැංකු සමිති කළමනාකරු හා බැංකු කළමනාකරු,
සමෘද්ධි සංවර්ධන නිලධාරි,
සමෘද්ධි බැංකු සමිති සභාපති හා බැංකු සභාපති.

**සමෘද්ධිලාභීන් , පොරොත්තු ලේඛනගත අඩුආදායම්ලාභීන් , ජීවනෝපාය මාර්ග අහිමිවූවන් සහ අභියාචනා මඟින් තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා සමාජ ප්‍රතිලාභ දීමනාව ගෙවීම - 2020 මැයි**

උක්ත සඳහන් කරුණට අදාලව , ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකායේ සභාපති / ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා හා කාන්තා , ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ ගරු අමාත්‍ය පවිත්‍රා වන්නිආරච්චි මැතිනියගේ ප්‍රධානත්වයෙන් හා ලේකම්තුමිය , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු මාණ්ඩලික නිලධාරීන් , දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන් හා සහකාර අධ්‍යක්ෂකවරුන්ගේ සහභාගීත්වයෙන් 2020.05.05 වන දින අරලියගහ මන්දිරයේ දී පැවති සාකච්ඡාවට අනුව ගනු ලැබූ තීරණ පරිදි පහත සඳහන් උපදෙස් ලබා දෙනු ඇත.

**01.** අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා තීරණය කර ඇති පරිදි සමෘද්ධිලාභී පවුල් , පොරොත්තු ලේඛනගත අඩු ආදායම්ලාභී පවුල් , ජීවනෝපාය මාර්ග අහිමි වූ පවුල් සහ අභියාචනා මඟින් තෝරාගත් ප්‍රතිලාභී පවුල් සඳහා 2020 අප්‍රේල් මස ගෙවන ලද දීමනාව , 2020 මැයි මාසය සඳහා ද ඒ අයුරින් ම ගෙවීමට මූලික කටයුතු සැලසුම් කර ගතයුතු වේ.

**02.** 2020 මැයි මාසයට අදාල සමාජ ප්‍රතිලාභ රුපියල් 5,000/-ක (රුපියල් පන්දහස) දීමනාව ගෙවීමට සැලසුම් කිරීමේ දී , 2020 අප්‍රේල් මස ගෙවන ලද හා හැඳුනුම්පත් අංක අනුව පරිගණක ගත කල ලැයිස්තු **සමෘද්ධිලාභී පවුල් , පොරොත්තු ලේඛනගත පවුල් , ක්ෂේත්‍ර අනුව වර්ග කරන ලද ජීවනෝපාය මාර්ග අහිමි වූ පවුල් සහ අභියාචනා මඟින් තෝරා ගත් ප්‍රතිලාභී පවුල්** ලෙස වෙන් වෙන් වශයෙන් සකස් කර ගත යුතු වේ .

**03.** 2020 මැයි මාසයට අදාල සමාජ ප්‍රතිලාභ දීමනාව වඩාත් කාර්යක්ෂම හා විනිවිදභාවයකින් යුතුව ගෙවීම් කිරීම සඳහා , සෑම ග්‍රාම නිලධාරී වසමක් ම ආවරණය වන ලෙස පහත සඳහන් පරිදි කටයුතු සැලසුම් කරගත යුතු ය.

I. 2020 මැයි 18 සිට 29 වන දින දක්වා දීමනා ගෙවීමට කටයුතු කල යුතු අතර 23, 24 හා 25 යන නිවාඩු දින වල දී දීමනා ගෙවීමට වසම් භාර නිලධාරීන් තීරණය කරන්නේ නම් පමණක් ඒ සඳහා අවශ්‍ය කරන මුදල් සමෘද්ධි බැංකු කළමණාකරු විසින් ලංකා බැංකු හා මහජන බැංකු කළමණාකරුවන් සමඟ සාකච්ඡා කර සූදානම් කර ගත යුතු වේ.

II. වැඩ බලන වසම් ද ඇතුළු ව එක් නිලධාරියෙකුට ප්‍රතිලාභීන් 500 දෙනෙකුට වඩා හෝ එක් සමෘද්ධි බැංකුවකට ප්‍රතිලාභීන් 6000කට වඩා මෙම දීමනා ගෙවීමට සිදු වන්නේ නම් , එම බැංකු ඇතුලත් ලේඛනයක් දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යක්ෂ විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් සකස් කර **"ක්ෂුද්‍ර මූල්‍ය අංශය (bank@samurdhi.gov.lk) "** වෙත විද්‍යුත් තැපැලෙන් මැයි මස 15 දිනට ප්‍රථම එවීමට කටයුතු කල යුතු ය.

III. සෑම ග්‍රාම නිලධාරී වසමක ම ග්‍රාමීය කමිටු නිලධාරීන්ගේ සහය ඇති ව සමාජ ප්‍රතිලාභ දීමනාව පෙරවරු 11.00ට පෙර ආරම්භ කර පස්වරු 5.00 පමණ වන තෙක් ගෙවීමට හැකි ය.

IV. එක් දිනකට ප්‍රතිලාභීන් 100කට වැඩි නොවන පරිදි දීමනා ගෙවීමට කටයුතු කල යුතු ය.

V. එක් එක් ග්‍රාම නිලධාරී වසමේ සමෘද්ධිලාභී පවුල් , පොරොත්තු ලේඛනගත පවුල් , ජීවනෝපාය මාර්ග අහිමු වූ පවුල් සහ අභියාචනා මඟින් තෝරා ගත් ප්‍රතිලාභී පවුල් සඳහා නිවසට ම ගොස් හෝ නිවස ආසන්නයට ගොස් එකවර ගෙවීම් කිරීමට හැකි වන පරිදි අදාල ගම්ගොඩැල්ල , මාවත හෝ පටුමඟ කාල වේලාවන් අනුව සැලසුම් කරගත යුතු ය. ගෙවීම් කිරීමට සැලසුම් කරගත් එම දින හා වේලාවන් අදාල ප්‍රතිලාභීන් වෙත කල් වේලා ඇති ව දැනුම් දීමට සුදුසු වැඩපිළිවෙළක් සකස් කර ගත යුතු ය.

VI. 2020 අප්‍රේල් මාසයට අදාල දීමනා ගෙවීමේ දී , මාධ්‍යයන් මඟින් පෙන්වා දුන් අඩුපාඩු නැවත ඇති නොවන පරිදි 2020 මැයි මස දීමනාව ගෙවීමට කටයුතු සැලසුම් කරගත යුතු වේ.

**04.** ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් සමෘද්ධි ප්‍රජාමූල බැංකුව වෙත මුදල් ගෙන ඒමේ දී හා එම මුදල් බැංකුව තුල තබා ගැනීමේ දී අදාල වන රක්ෂණ ආවරණය, මෙම සමාජ ප්‍රතිලාභ දීමනාව ගෙවීම් සිදු කරන කාල සීමාවට පමණක් රුපියල් 10,000,000/- (රුපියල් මිලියන දහය) දක්වා වැඩි කරනු ඇත. අවශ්‍යතාවය පරිදි දිනකට අවශ්‍ය මුදල් ප්‍රමාණය වාර කිහිපයක දී වුව ද ගෙන ඒමට හැකියාව ඇත.

**05.** සමෘද්ධි ප්‍රජාමූල බැංකුව වෙත මුදල් ගෙන ඒමේ දී , එම මුදල් වැඩි ප්‍රමාණයක් රාත්‍රී කාලයේ සමෘද්ධි බැංකුවේ තබා ගැනීමේ දී හා දීමනා ගෙවීම සඳහා ග්‍රාම නිලධාරී වසම් වෙත මුදල් ගෙන යාමේ දී ප්‍රදේශය භාර පොලිස් ස්ථානාධිපති සමඟ සාකච්ඡා කර සුදුසු ආරක්ෂිත වැඩපිළිවෙලක් සැලසුම් කර ගතයුතු වේ.

**06.** 2020 මැයි මාසයට අදාල සමාජ ප්‍රතිලාභ රුපියල් 5,000/-ක දීමනාව ගෙවීමට අදාලව ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් **ස්ථාන , දින හා වේලාවන්** සැලසුම් කර සමෘද්ධි බැංකුව වෙතත් , සමෘද්ධි බැංකු මට්ටමින් එම සැලස්ම බැංකු සමිතිය වෙතත් , ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එම සැලසුම් දිස්ත්‍රික් කාර්යාලය වෙතත් ගෙන්වා ගෙන ගෙවීම් අවසන් වන දින ඇතුලත් වන පරිදි සමෘද්ධි බැංකු මට්ටමින් සකස් කරන ලද සැලැස්ම දිස්ත්‍රික් කාර්යාල විසින් 2020 මැයි මස 14 දිනට ප්‍රථම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ **"සහනාධාර අංශය (divirelief@gmail.com) " හා "ක්ෂුද්‍ර මූල්‍ය අංශය (bank@samurdhi.gov.lk) "** වෙත විද්‍යුත් තැපෑලෙන් එවීමට කටයුතු කල යුතු ය.

**07.** 2020 අප්‍රේල් මාසයට අදාලව මෙම සමාජ ප්‍රතිලාභ දීමනාව ගෙවීමට දායක වූ ග්‍රාම නිලධාරී වසම් භාරව කටයුතු කල සියළු දෙනාටත් , සමෘද්ධි බැංකු හා බැංකු සමිති කාර්යය මණ්ඩලයටත් , ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් ඇතුළු සියළු සමෘද්ධි කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තූතිය පුද කරමි.

**08.** Covid - 19 වෛරසය ශ්‍රී ලංකාව තුල වසංගත තත්ත්වයකට පත්වීම වලක්වා ගැනීම සඳහා සෞඛ්‍ය හා ආරක්ෂක අංශ විසින් ලබා දෙන ලද උපදෙස් අනුව කටයුතු කරමින් , ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය හා ජන ජීවිතය යථාතත්ත්වයට පත් කර ගැනීම වෙනුවෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍ය ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය
2. ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකායේ සභාපති / ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා

   } - ලබා දුන් උපදෙස් අනුව කා.දැ.ස.

3. ජනාධිපති ලේකම් ,ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා
4. අග්‍රාමාත්‍ය ලේකම්, ගාමිණී එස්. සෙනරත් මහතා
5. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
6. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය
7. රාජ්‍ය ලේකම් ,සමාජ ආරක්ෂණ අංශය
8. අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්/ සම ලේකම් , ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යය සාධන බලකාය ඇන්ටන් පෙරේරා මහතා
9. විගණකාධිපති ,විගණකාධිපති දෙපාර්තමේන්තුව

   } - කා.දැ.ස.

10. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
11. අධ්‍යක්ෂ, ක්ෂුද්‍ර මූල්‍ය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
12. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

   } - අ.ක.ස.